# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2238/31 - 2021 ජූලි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2021.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 25 වන වගන්තිය යටතේ මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 දෙසැම්බර් මස 31 වැනි දින අංක 1947/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 986 දරන සුරාබදු නිවේදනයේ II වැනි කොටසෙහි සඳහන් (i) තරු 3 හා තරු 4 හෝටල් සහ (ii) තරු 5 හා ඊට ඉහළ ගණයේ හෝටල්/බුටික් හෝටල්/බුටික් විලා/පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා මධ්‍යසාර භාවිතයට අයකරනු ලබන ගාස්තුව 2021 වර්ෂය සඳහා පමණක් ගෙවීම නිදහස් කරමින් සංශෝධනය කරන ලද පරිදි, රීති පනවන අංක 2210/2 දරන 2021 ජනවාරි මස 11 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 06/2021 දරන සුරාබදු නිවේදනය, 2021 මැයි මස 04 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

**එස්. ආර්. ආටිගල,**
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2021 ජූලි 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

08 - 207


1A - G 34765 — 35 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*